**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 මැයි මස 28 වන දින සිට ජූනි මස 02 වන දින දක්වා**

**වසරේ තේමාව තුළ ප්‍රකාශ වන ශුද්ධවූ ත්‍රිත්වික බැඳීම**

01. ආරම්භක ප්‍රශංසාව

පුබුදු ගී අංක 10 "ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ ...."

ප්‍රශංසාවට හැඳින්වීම :

දෙවි මහෝත්තමයාණන් මැවූ සියල්ල ඔවුන් වහන්සේට ස්තූති ප්‍රශංසා කරන්නේය. මුළු මැවිල්ලෙහි අගතැන් ගන්නා මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ දැහැමිකම හා කරුණාව නිතැතින් පැසසිය යුතුයි. විමුක්තිය සලසා දුන් අන් කෙනෙකු මෙදියත නැත. ගැළවීම සලසා දුන් අන් දෙවි කෙනෙකු මුළු පොළෝ තලයේ නැත. අවංක සිතින් දෙවිඳුන් සරණ යන්නන් හට කරුණාව පාන, දයාව පෙන්වන, ඔවුන්ගේ ජීවිතයේ ප්‍රබල ක්‍රියා සිදු කරන දෙවිඳාණන් හට ගීතාවලියේ 33 වන ගීතිකාව ද උදව් කර ගනිමින් ප්‍රශංසා කරමු.

පුබුදු ගී 135 "සකල මැවිල්ලට..."

02. ආපසු බැලීම : (ළඟ සිටින කෙනකු සමඟ බෙදා ගන්න)

1. පසුගිය සතිය පුරා ජීවත් වන්නට අපට දුන් වචනයට අවදි වන්නට ඔබට හැකිවීද?
2. ශුද්ධාත්ම ස්නාපනයක් ලැබූවකු ලෙස ජීවිතයේ මුහුණ දුන් සෑම අභියෝගයකදීම දෙවියන් වහන්සේගේ ආදරය අත්දකින්නට, දේව සිත විමසන්නට, දේව වචනය බාර ගන්නට ඔබට හැකිවීද?

03. දවසේ සුපුවත: **වසරේ තේමාව තුළ ප්‍රකාශ වන ශුද්ධවූ ත්‍රිත්වික බැඳීම**

මේ වසරේ තේමාව අප වෙත තෑගි කරන්නට ස්වාමි තාත්තාව තෝරා ගැනීම දෙවියන් වහන්සේගේ අභිරහස්මක ක්‍රියාවකි. තේමාවේ අන්තර්ගතය අප ශුද්ධවූ ත්‍රිත්වයම වෙත යොමු කරයි.එනම්,

* ඔබ වහන්සේගේ ආශිර්වාදය ලැබේවා !
* ඔබ වහන්සේගේ වචනය ලැබේවා !
* ඔබ වහන්සේගේ කැමැත්ත ලැබේවා !

- ඔබ වහන්සේ :- දෙවියන් වහන්සේ, දේව තාත්තා, අබ්බා තාත්තා, ශුද්ධවූ ත්‍රිත්වයේ මූලාරම්භය, ප්‍රථමයාණෝ.

- වචනය :- වචනයාණෝ, ක්‍රිස්තුන් වහන්සේ, ශුද්ධවූ ත්‍රිත්වයේ දෙවන තැනැන්වහන්සේයි. අපි කියනවා වාක්‍යයාණෝ, වචනයේ තෙම මාංශගත වූ සේක; අප සමඟ ද වාසය කළ සේක.

ශු.බයිබලයේ සඳහන් වන පරිදි ක්‍රිස්තුන් වහන්සේව ධර්මයාණෝ ලෙස හඳුන්වනු ලබයි. "ආරම්භයේදී වාක්‍යයාණෝ සිටි සේක. වචනයාණෝ දෙවියන් වහන්සේවම සිටි සේක. ආරම්භයේදී දෙවියන් වහන්සේ ඔවුන් වහන්සේ සමඟ සිටි සේක.(ශු.ජොහාන් 1:1-3, ශු.ජොහාන් 1:14) අපට පේනවා ජුවාම් තුමා ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වනවා වාක්‍යයාණෝ, වචනයාණෝ, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ලෙස.

- කැමැත්ත :- වචනයාණන්ට, ක්‍රිස්තුන් වහන්සේට අරමුණක් තිබුණා. ඒ අරමුණ තමයි දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම. "මාගේ අරමුණ මාගේම කැමැත්ත ඉටු කිරීම නොව, මා එවා වදාළ ඔවුන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමය." (ශු.ජොහාන් 5:30)

- ගින්න :- ගින්න යනුවෙන් අදහස් කරනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේවයි. ශුද්ධාත්මයාණෝ ශුද්ධවූ ත්‍රිත්වයෙ තුන්වන තැනැන් වහන්සේයි. "පොළොව මත ගිනිලන්න ආවෙමි; ගින්න දැනටම ඇවිලී ඇත්නම් කොපමණ හොඳද? (ශු.ලූක් 12:49)

සමිඳාණන් වහන්සේ ප්‍රකාශ කරන මේ වචනයේ ගැඹුර පියාණන් වහන්සේ තමන් වහන්සේ තුළ අවුලන ලද ගින්නෙන් ඇවිලෙමින් කුරුසියේ මරණයට පත්වෙමින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපට තෑගි කිරීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේව ලැබුනු පුද්ගලයා ශුද්ධාත්ම ගින්නෙන් ඇවිලෙන්නෙකු බවට පත්වේ. ක්‍රියාකාරී කෙනෙකු වෙයි. දෙවියන් වහන්සේගේ වචනය ගින්නක්. එම ප්‍රේමය ගින්න වන ශුද්ධාත්මයාණන් වහන්සේය.

- ආශිර්වාදය :- දේව වචනයට කීකරුවීම, අවනතවීම, දේව කැමැත්ත ඉටු කිරීම, ගින්නෙන් දැවීම, ඇවිලීම තුළ ජීවිතයෙන් සාක්ෂි දැරීමේදී ශුද්ධවූ ත්‍රිත්වික ආශිර්වාදය අපට ගලා එයි.

04. අප දෙසට : (ළඟ සිටින කෙනෙකු සමඟ සාංඝික වන්න)

* ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි" පසුකලාවූ කාලය තුළ අප ලද තේමාව ජීවත් කරවන්නට ඔබට හැකිවීදැයි සාකච්ඡා කරන්න.

* දෙවියන් වහන්සේගේ වචනය, කැමැත්ත ගින්නක් ලෙස ඔබ තුළ ඇවිලෙන විට එහි අභිරහස්මක බව ත්‍රිත්වික ප්‍රකාශනය හඳුනා ගන්නට අපට හැකිවීද?

05. අවසන් ප්‍රශංසාව :

දේව වචනයට කීකරු වීම තුළ, දේව කැමැත්ත ඉටු කිරීම තුළ දේවාශිර්වාදය ලබන්නට බලය පතා ළඟ සිටින කෙනෙකු ස්පර්ශ කොට යාච්ඤා කරන්න.

"සුදත් බලයෙන් පිරෙමු දැන්.... "

******************************